<u>රත්නපුර ප්‍රාදේශීය සභාව</u>
<u>රත්නපුර දිස්ත්‍රික්කය</u>

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 02 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 11 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 නොවැම්බර් 20 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට රත්නපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
-------------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිත අංක 01 හි 21 ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශන කට්ටලය සමඟ ඉදිරිපත් කළ යුතු පහත සඳහන් ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

i. මුදල් ප්‍රවාහ ප්‍රකාශය.
ii. අයවැයගත සංඛ්‍යා හා සත්‍ය සංඛ්‍යා අතර සන්සන්දනාත්මක හෝ මූල්‍ය ප්‍රකාශන වල අයවැයගත සංඛ්‍යාවන් වෙනම තීරුවක් ලෙස දැක්වීම.

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු ජේසීබී යන්ත්‍රය සභාව මඟින් ඉටු කරනු ලබන ඍජු කර්මාන්ත වලට යෙදවීම වෙනුවෙන් සභාවට වන ආදායම සමාලෝචිත වර්ෂයේදී රු. 2,542,100 ක් ලෙස තක්සේරු කර තිබුණද, එම වටිනාකම සභාවේ ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ ගෙවීම් කර තිබූ 2013 වර්ෂයේ වැය විෂයයන්ට අදාල රු. 222,138 ක බැදීම් 2013 වර්ෂයේ ණයහිමි ශේෂයට නොගැනීම හේතුවෙන් වර්ෂාවසාන ණයහිමි ශේෂය එකී වටිනාකමින් අඩුවෙන් දක්වා තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ වියදමද අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) දෝෂසහගත ගිණුම්කරණය හේතුවෙන් ඉකුත් වර්ෂයේ අවසානයට නොපියවන ලද අත්තිකාරම් රු. 338,848 කට අදාලව ණයහිමියන් වශයෙන් වෙන් කිරීම් කර වැය ශීර්ෂයට ගැලපීම් කර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයන්හි අධි බිල් කිරීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම් වලට අදාල හිඟ ආදායම් (ණයගැති) ශේෂය රු. 2,481,359 ක් වැඩියෙන් දක්වා තිබුණද, එය ලෙජර් ගිණුම් මඟින් ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2012 නොවැම්බර් මස සිට කිසිඳු මුද්දර ගාස්තු ආදායමක් සභාවට ලැබී නොමැති අතර, 2013 වර්ෂය සඳහා බිල්කල මුද්දර ගාස්තු ආදායම රු. 5,000,000 ක් පමණක් හිඟ ආදායම් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ මුද්දර ගාස්තු ආදායම් ඌන වෙන්කිරීම් ලෙස දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගනු ලැබූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වටිනාකම රු. 10,000 ක් අඩුවෙන්ද, ලීබඩු හා සවි කිරීම් රු. 10,000 ක් වැඩියෙන්ද ජ'නල් සටහන් මඟින් ගිණුම්ගත කර තිබුණි.

(උ) ඉකුත් වර්ෂයේ පැවති පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව සඳහා මන්ත්‍රීවරයෙකු වෙනුවෙන් ගෙවන ලද රු. 40,000 ක් වූ පාඨමාලා ගාස්තුව සමුච්චිත අරමුදලට ගලපනු වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමට ගලපා ඇති බැවින් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන ඇති රු. 204,745 ක් වටිනාකමැති ස්ථාවර වත්කම් ස්ථාවර වත්කම් ගිණුමට හර කර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම බැර කර නොතිබුණි.

(එ) 2013 දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව ශේෂය රු. 1,795,768 ක්ද, බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව මුදල් ශේෂය රු. 1,785,868 ක්ද, ප්‍රධාන ලෙජරයට අනුව මුදල් ශේෂය රු. 2,142,405 ක්ද, වශයෙන් ප්‍රාදේශීය සභාවේ මුදල් ගිණුමේ ශේෂයෙහි වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 නොසැසඳූ පාලන ගිණුම්

-----------------------------

ගිණුම් විෂයයන් 08 කට අදාලව 2013 දෙසැම්බර් 31 දිනට පාලන ගිණුම අනුව ශේෂයෙහි එකතුව රු.17,253,858 ක් වූ අතර, උපයෝගී ලේඛණය අනුව ශේෂයන්ගේ එකතුව රු.14,791,323 ක් වූයෙන් රු.2,462,535 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

ප්‍රධාන ලෙජරයේ දිගුකාලීනව අක්‍රීයව පැවති එකතුව රු. 218,746 ක් වූ සහා වත්කම් හා වගකීම් ගිණුම් 07 ට අදාලව කිසිඳු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවුණි.

1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | | අනුකූල නොවීම්. |
|---|---|---|
| (අ) | <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u> | |
| (I) | මුදල් රෙගුලාසි 371 | 2005 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා අවස්ථා 12 කදී ගෙවා තිබූ එකතුව රු. 215,048 ක් වූ අත්තිකාරම් 2014 අප්‍රේල් 08 දින දක්වාම පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (II) | මුදල් රෙගුලාසි 371 (2) | සමාලෝචිත වර්ෂය තුලදී රු. 20,000 ක සීමාව නොසලකා අවස්ථා 10 කදී එකතුව රු. 653,500 ක අත්තිකාරම් මුදල් නිදහස් කර තිබුණි. |

| | | |
|---|---|---|
| (III) | මුදල් රෙගුලාසි 1645 | වාහන 03 කට අදාල ධාවන සටහන් විගණනයට ඉදිරිපත් නොවුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ 2005 ජුනි 08 දිනැති අංක 1396/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද රීති | සභා රැස්වීම් සඳහා සහභාගී නොවූ සභිකයින් 15 දෙනෙක් වෙනුවෙන් අවස්ථා 28 කදී සභික දීමනා වශයෙන් එකතුව රු.140,000 ක්වූ මුදලක් සමලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. |
| (ඇ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත ප්‍රකාරව පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් ප්‍රකාශිත 1986 මාර්තු 10 දිනැති අංක 392/9 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියෝග මාලාවේ අංක 22(1) දරන නියෝගය | විකුණනු ලබන ඉඩම් ප්‍රමාණයෙන් සියයට 10 ක භූමිභාගයක් පොදු කටයුතු සඳහා සභාව වෙත ඔප්පුවක් මඟින් ලබාගත යුතු වුවත්, විලකොලදෙණිය වත්තේ අක්කර 4 පර්චස් 25.64 ක් වෙන්දේසි කිරීම සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |

1.3.7 අවිධිමත් ගනුදෙනු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාපතිවරයාට ඉන්ධන අත්තිකාරම් වශයෙන් අවස්ථා 10 කදී රු. 500,000 ක් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371(2)ආ විධිවිධානවලට පටහැනිව ලබා දී තිබූ අතර, යථෝක්ත අත්තිකාරම් ලබා දීම සඳහා ලද අනුමැතියක් විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

(ආ) භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මඟින් නිර්දේශ කලද, මූලා ප්‍රකාශන අනුමත කරන විටත් ඉවත් කර නොතිබූ එකතුව රු. 1,881,708 ක් වූ භාණ්ඩ සඳහා මූලා ප්‍රකාශන මඟින් ගැලපීම් කර තිබුණි.

2. මූලා සමාලෝචනය

-----------------------

2.1 මූලා ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූලා ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් වියදම ඉක්මවූ මෙහෙයුම් අයභාරය රු. 3,916,769 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් වියදම ඉක්මවූ මෙහෙයුම් අයභාරය රු. 4,192,313 ක් විය.

2.2 විග්‍රහාත්මක මූලා සමාලෝචනය

--------------------------------------

පසුගිය වර්ෂයන්ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූලා මෙහෙයුම් අතිරික්තය සියයට 65 කින් අඩු වී ඇති අතර, ඊට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයන්ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු හා කුලී ආදායම් අඩුවීමත්, සමස්ථ පුනරාවර්තන වියදම වැඩිවීමත් වේ.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 131 | 37 | - |
| බදු කුලී | 1,500 | 14 | - |
| බලපත්‍ර ගාස්තු | 637 | 531 | 207 |
| වෙනත් ආදායම් | 13,898 | 13,856 | - |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී 2012 අප්‍රේල් සිට 2012 ඔක්තෝබර් දක්වා උසාවි දඩ ආදායම රු. 4,894,458 ක් ලැබී තිබූ අතර, 2013 ජූලි මස දක්වා පමණක් ආදායම් හඳුනාගෙන තිබුණි.

(ආ) 2011 ජනවාරි මාසයේ සිට 2012 ඔක්තෝබර් මස දක්වා කාලයට අදාලව ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගෙන් ලැබිය යුතු රු. 12,660,076 ක මුද්දර ගාස්තු ආදායමක් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණද, 2012 ඔක්තෝබර් මස සිට කිසිඳු ආදායමක් හඳුනාගැනීමට හෝ ගෙන්වා ගැනීමට කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.3.3 පෙරසැරි ගාස්තු

පෙරසැරි ගාස්තු වශයෙන් රු.150,000 ක් බැගින් රු.300,000 ක් පමණක් අයකර තිබූ අතර, සවිකිරීම් 14 ක් සම්බන්ධයෙන් කිසිඳු ගාස්තු අය කිරීමක් සිදු කර නොතිබුණි.

2.3.4 වෙනත් ආදායම්

(අ) ත්‍රීරෝද රථ ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් සකස් කර නොතිබූ අතර, විගණිත දිනය වූ 2014 අප්‍රේල් 09 දින වනවිටත් ත්‍රීරෝද රථ සංගම් 02 කින් ඉල්ලුම්පත් ලියාපදිංචිය සඳහා ලැබී තිබුණද, ඒ සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද, දැන්වීම් ප්‍රචාරණ ආදායම් රැස් කිරීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් සකස් කර 2013 ගැසට් නිවේදනයේ පල කර තිබුණද, කිසිඳු ආදායමක් උපයා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) කර්මාන්ත බදු, වෙළඳ බලපත්‍ර සහ ව්‍යාපාර බදු අයකිරීම් සම්බන්ධයෙන් සභාවට ලැබෙන ඉල්ලුම්පත්‍ර වල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී නිර්දේශය, මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් වෙළඳ ව්‍යාපාරික ස්ථානය පරීක්ෂා කල බවට වාර්තාව හා බලපත්‍ර නිකුත් කිරීමේ නිර්දේශයන් ලබා නොගෙන බලපත්‍ර නිකුත් කල අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය. තවද, සභා බල ප්‍රදේශයට අදාල කර්මාන්ත සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර ලේඛණයක් නඩත්තු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ මඟින් පෙන්වා දී ඇති වෙන්දේසි කලයුතු, විනාශ කලයුතු හා අළුත්වැඩියා කලයුතු රු. 1,857,500 ක වටිනාකමැති භාණ්ඩ සම්බන්ධයෙන් විගණිත දිනය වූ 2014 මැයි 30 දින වනතුරුද කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී භාණ්ඩ ඒකක 241 ක් සමීක්ෂණය සඳහා ඉදිරිපත් වී නොතිබුණද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 හා 2013 වර්ෂයන්හීදී ජේසීබී යන්ත්‍රය සඳහා රු. 2,769,943 ක වියදම් දරා ඇති නමුත්, එම වර්ෂයන්හීදී පිළිවෙලින් යන්ත්‍ර පැය 614 ක් හා 941 ක් පමණක් සේවයේ යොදවා ඇති බව නිරීක්ෂණය විය. තවද, ජේසීබී යන්ත්‍රයේ ඉන්ධන ටැංකියේ උපරිම ධාරිතාව ලීටර් 110 ක් වුවද ඉන්ධන යෙදීම, ධාවන සටහන්, මිලදී ගැනීම් හා ලදුපත් අතර වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ඉකුත් වර්ෂය තුල රු. 247,000 ක් වැය කර ප්‍රීමික්ස් ව්‍යාපෘතිය සඳහා මිලදී ගෙන තිබූ වැලි කියුබ් 26 ක තොගයෙන් 2014 අප්‍රේල් 09 දිනැති භෞතික පරීක්ෂාවට අනුව වැලි කියුබ් 06 ක් පමණක් සභා භූමියේ පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව රු. 190,000 ක් වටිනාකමැති වැලි කියුබ් 20ක් භාවිතා කළ කාර්යයන් පිළිබඳව තොරතුරු විගණනයේදී අනාවරණය නොවීය.

3.3 විදේශ ගමන්

---------------

(අ) විදේශ සංචාර සඳහා වැයවන සියලු වියදම් විදේශීය සංවිධාන විසින් දැරිය යුතුව තිබුණද 2013 පෙබරවාරි 26 දින සිට මාර්තු 03 දක්වා තායිලන්ත සංචාරය සඳහා සභිකයින් දහතුන්දෙනකුට රු. 90,000 බැගින් සභා අරමුදලින් රු. 1,170,000 ක වියදම් දරා තිබුණි.

(ආ) තවද, විදේශ සංචාරය සඳහා සහභාගී වන අය රටින් බැහැර යාම සඳහා ජනාධිපති ලේකම්ගේ අංක සීඑස්ජේ/1/1/16 හා 2012 ජූනි 11 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව අතිගරු ජනාධිපති තුමාගේ අවසරය ලබාගත යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබූ අතර, පුහුණුව අවසානයේ ලබාගත් දැනුම දේශීය වශයෙන් උපයෝගී කරගන්නා ආකාරය පිළිබඳ වාර්තාවක්ද ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2010 ඔක්තෝබර් 11 දිනැති මු.ක්‍රි.අ. 01/2010/01 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම් හා භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛයෙහි 2 ( i ) වගන්තිය ප්‍රකාරව විදේශ ගමන් දීමනා හා ඒ ආශ්‍රිත වියදම් ලබා ගැනීම සඳහා විධිමත් පරිදි රාජකාරී නිවාඩු අනුමත කර තිබිය යුතු වුවද, කිසිඳු නිවාඩු අනුමැතියකින් තොරව තායිලන්තයේදී පැවති පුහුණු වැඩමුළුව සඳහා සහභාගී වූ සභිකයින් 13 දෙනෙකු වෙනුවෙන් දිනකට ඇමරිකන් ඩොලර් 30 බැගින් ඇමරිකන් ඩොලර් 2340 ක් ලෙස රු. 297,882 ක් සභා අරමුදලින් දරා ඇති බව නිරීක්ෂණය විය.

(ඈ) 2013 ඔක්තෝබර් 20 දින සිට ඔක්තෝබර් 25 දින දක්වා ප්‍රාදේශීය සභා සභිකයෙකුට ඉන්දුනීසියාවේ සංචාරයක් සඳහා සභා අරමුදලින් වියදම් දැරීමට ප්‍රධාන අමාත්‍ය තුමාගේ අනුමැතිය ලැබී ඇති බවට පළාත් පාලන කොමසාරිස්ගේ දැනුම් දීම අනුව අංක 950 හා 2013 ඔක්තෝබර් 10 දිනැති වවුචරය මඟින් රු. 150,000 ක වියදම් දරා තිබුණි. තවද, මෙම සභිකයා වෙනුවෙන් තායිලන්ත සංචාරය සඳහා ගමන් වියදම් ලෙස 2013 පෙබරවාරි 26 දින සිට මාර්තු 03 දක්වා රු. 112,914 ක වියදමක් දරා තිබුණි. රටින් බැහැර යාම සඳහා අතිගරු ජනාධිපති තුමාගේ අවසරය ලබාගෙන නොතිබූ අතර, සංචාරය සඳහා සහභාගී වීමට

විදේශගත වීමට ප්‍රථම නිවාඩු අනුමත කල යුතු වුවද, සභිකයාගේ නිවාඩු අනුමත කර නොතිබුණි. උක්ත සංචාරය සඳහා ඔහු සහභාගී වූයේද යන්න තහවුරු කර ගැනීම සඳහාද කිසිඳු ලියවිල්ලක් විගණනයට ඉදිරිපත් නොවුණි.
ඉන්දුනීසියානු පළාත් පාලන ක්‍රමය සම්බන්ධයෙන් ලබාගත් දැනුම දේශීය වශයෙන් උපයෝගී කරගන්නා ආකාරය පිළිබඳව වාර්තාවක් පුහුණුව අවසන් වී මාස 06 ක කාලයක් ගතවී තිබුණද, එවැනි වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

3.4 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

ලියාපදිංචි අංක 60 – 6849 දරන ලොරි රථය 2012 වර්ෂයේ සිට ධාවනය කල නොහැකි තත්ත්වයෙන් සභා පරිශ්‍රයේ ගාල් කර තිබූ බව පරීක්ෂණයේදී අනාවරණය විය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතී මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

4.2 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වැය විෂයයන් 20 කට අදාලව වෙන් කරන ලද රු. 295,500 ක ප්‍රතිපාදන කිසිඳු වියදමක් නොදරා ඉතිරි වී තිබූ අතර, වැය විෂයයන් 23 කට අදාලව වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් රු. 4,743,409 ක් ඉතිරි වී තිබුණි.

5. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය

(ii) ආදායම් පරිපාලනය

(iii) අයවැය පාලනය